# ගෙවුම් තුලනය

1987 දී වෙළෙඳ සහ ජංගම ගිණුම යන දෙඅංශයෙන්ම ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයෙහි සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කෙරිණි. 1986 දී විගැහි දශ ලක්ෂ 649 ක්ව පැවති වෙළෙඳ ගිණුමේ හිඟය 1987 දී විගැහි දශ ලක්ෂ 531 දක්වා පහත වැටිණ. මෙම වර්ධනය පිළිබිඹු කරමින් ජංගම ගිණුමේද වඩා යහපත් තත්ත්වයක් ඇතිවීම නිසා එම ගිණුමේ හිඟය විගැහි දශ ලක්ෂ 363 සිට විගැහි දශ ලක්ෂ 266 දක්වා අඩු විය. රටක ගෙවුම් තුලනයේ දුර්වලත්වය මිනිය හැකි මූලික දර්ශකය වූ ජංගම ගිණුමේ හිඟය/දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතය 1986 දී සියයට 6.6 සිට 1987 දී සියයට 5.2 දක්වා පහත වැටුණි. නිල සංක්‍රාම ඉවත් කළ පසු ජංගම ගිණුමේ හිඟය කලින් වසරේ විගැහි දශ ලක්ෂ 516 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 405 දක්වා අඩුවූ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත් කල එය දෙවසර අතරතුරදී සියයට 9.5 සිට සියයට 7.9 දක්වා පහත වැටිණ. කෙසේ වුවද, සමස්ත ශේෂය තවදුරටත් හිඟයක්ව පැවතුණු අතර, 1987 දී එම හිඟය විගැහි දශ ලක්ෂ 72 ක් විය. රටෙහි ගෙවුම් තුලන තත්ත්වයෙහි තවදුරටත් පවත්නා දුර්වලත්වය කියා පාමින් නොකඩවා තෙවැනි වසරටත් සමස්ත ශේෂයේ ඇතිවූ හිඟය පියැවීම සඳහා විදේශීය සංචිතයන් උපයෝගී කර ගැනීමට සිදු විය.


පසුගිය වර්ෂ තුන ඇතුලත සමස්ත ශේෂයෙහි නොකඩවා පැවති හිඟයන් හේතුවෙන් විදේශීය සම්පත්වල සිදුවූ සමුච්චිත පහත වැටීම, 1983–84 කාලය තුළ වූ තේ උත්පාතය නිසා සංචිත ප්‍රමාණයෙහි සිදුවූ වැඩිවීමෙන් ආසන්න වශයෙන් සියයට 90 ක් පමණ ඉවත්කර දැමීමට සමත් විය. සමස්ත ශේෂයෙහි හිඟයක් ඇතිවේයයි කල්තබා දැනසිටියද, පාරම්පරික අපනයනයන්හි දුර්වල ක්‍රියාකාරිත්වය, සංචාරක ඉපැයීම් අඩු වීම සහ විදේශාධාර ලැබීම්හි සැහෙන අඩු වීමක්ද නිසා 1987 අවසානයේදී සමස්ත ශේෂයේ වඩා විශාල හිඟයක් දක්නට ලැබිණි. විගැහි වටිනාකම අනුව අපනයන ලැබීම් සියයට 4.5 කින් වැඩි වුවද, එම ලැබීම් 1983–1987 දක්වා පස් වසරෙහි සාමාන්‍ය ප්‍රමාණය වූ විගැහි දශ ලක්ෂ 1,164 ට වඩා පහත මට්ටමක විය.

1984–1986 දක්වා කාලය තුළ ආසන්න වශයෙන් සියයට 30 කින් අඩුවූ අපනයන ඉපැයීම්, 1987 දී සුළු වර්ධනයක් පෙන්නුම් කරමින් සියයට 4.5 කින් වැඩි විය. තේ, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදිතවල මිළ සුළු වශයෙන් වැඩි වූ අතර, පොල් අපනයන මිළ සියයට 57.0 ක පමණ සැහෙන ප්‍රමාණයකින් ඉහළ ගියේය. සමස්ත අපනයන මිළ දර්ශකය විගැහි අනුව සියයට 3.9 කින් ඉහළ නැඟුණි. සියලුම ප්‍රධාන කෘෂි නිෂ්පාදිතවල අපනයන පරිමාව වර්ෂය තුළදී පහත වැටිණ. තේ, රබර් සහ ප්‍රධාන පොල් නිෂ්පාදිත පිළිවෙලින් සියයට 3.2, සියයට 3.7 සහ සියයට 51.3 කින් අඩු විය. අපනයන පරිමාව අඩු වීම නිසා සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ඉපැයීම් සියයට 4.5 කින් පහත වැටුණි. මුළුමනින්ම පාහේ, මසා නිමකළ ඇඳුම් අපනයන පුළුල්වීම හේතුකොට ගෙන කාර්මික අපනයනවල සියයට 9.2 ක වර්ධනයක් වාර්තා කෙරිණි. රෙදිපිළි හා මසා නිමකළ ඇඳුම් අපනයන ඉපැයීම් සියයට 16.3 කින් වැඩි වූ අතර, පසුගිය වසරේදී මෙන්ම, වැඩිම දළ විදේශ විනිමය ප්‍රමාණයක් ඉපැයූ එකම අංශය ලෙස තව දුරටත් පැවතිණ. එක්තරා දුරකට මැණික් වෙළෙඳාම ක්‍රමානුකූල කිරීම පිණිස තායිලන්තය සමඟ අත්සන් කරන ලද ගිවිසුමේ ප්‍රතිඵලයක් වශයෙන් මැණික් අපනයනයෙන් ලැබූ ආදායම සියයට 66.0 කින් ඉහළ නැඟුණි.

1987 දී ආනයන ගෙවීම් සියයට 4.3 කින් අඩු විය. මීට හේතු වූයේ පාරිභෝගික භාණ්ඩ සියයට 5.8 කින්, ආයෝජන භාණ්ඩ සියයට 7.3 කින් සහ ආරක්ෂක කටයුතු හා සම්බන්ධ ආනයන සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු වීමයි. ප්‍රධානතම ආනයන අතුරින් සහල්, තිරිඟු සහ පොහොර පරිමාව පිළිවෙලින් සියයට 51.0, සියයට 15.5 සහ සියයට 20.0 කින් පහත වැටුණි. එයට ප්‍රතිවිරුද්ධව, සීනි සහ බොර තෙල් ආනයන පරිමාව පිළිවෙලින් සියයට 16.8 කින් සහ සියයට 8.5 කින් වැඩි විය. 1987 දී, සහල් සහ බොර තෙල් ආනයන මිළ පිළිවෙලින් සියයට 7.4 කින් සහ සියයට 7.1 කින් ඉහළ ගිය අතර, තිරිඟු මිළ සියයට 7.5 කින් පහත වැටුණි.

# ගෙවුම් තුලනය

වාර්ෂිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 34 සංඛ්‍යා සටහන

## 1983 — 1987 ගෙවුම් තුලනය - විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 | 1986 (අ) | 1987 (ආ) | 1983 | 1984 | 1985 | 1986 (අ) | 1987 (ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ .. | - 20,168 | - 11,850 | - 19,801 | - 21,389 | - 20,743 | - 801 | - 453 | - 711 | - 649 | - 531 |
| අපනයන .. | 25,038 | 37,198 | 35,728 | 33,893 | 40,275 | 993 | 1,427 | 1,296 | 1,029 | 1,075 |
| ආනයන .. | 45,206 | 49,048 | 55,529 | 55,282 | 61,018 | 1,794 | 1,880 | 2,007 | 1,678 | 1,606 |
| 2. සේවා .. | - 1,411 | - 1,735 | - 3,647 | - 3,617 | - 4,257 | - 56 | - 66 | - 133 | - 109 | - 114 |
| ලැබීම් .. | 8,033 | 8,567 | 8,926 | 10,601 | 11,332 | 320 | 329 | 323 | 323 | 297 |
| ගෙවීම් .. | 9,444 | 10,302 | 12,573 | 14,218 | 15,589 | 376 | 395 | 456 | 432 | 411 |
| 3. භාණ්ඩ හා සේවා (1+2) .. | - 21,579 | - 13,585 | - 23,448 | - 25,006 | - 25,000 | - 857 | - 519 | - 844 | - 758 | - 645 |
| 4. සංක්‍රාම (ශුද්ධ) .. | 10,457 | 12,185 | 12,040 | 13,097 | 14,463 | 416 | 468 | 434 | 395 | 379 |
| පෞද්ගලික (ශුද්ධ) .. | 6,441 | 7,031 | 7,212 | 7,983 | 9,161 | 256 | 270 | 262 | 242 | 240 |
| නිල (ශුද්ධ) .. | 4,016 | 5,154 | 4,828 | 5,114 | 5,302 | 160 | 198 | 172 | 153 | 139 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) .. | - 11,122 | - 1,400 | - 11,408 | - 11,909 | - 10,537 | - 441 | - 51 | - 410 | - 363 | - 266 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය (ශුද්ධ) .. | 10,620 | 8,755 | 9,062 | 9,094 | 7,098 | 420 | 335 | 328 | 279 | 187 |
| පෞද්ගලික අංශය .. | 4,005 | 62 | 1,646 | 921 | 1,557 | 160 | 2 | 58 | 28 | 41 |
| රාජ්‍ය අංශය .. | 6,615 | 8,693 | 7,416 | 8,173 | 5,541 | 260 | 333 | 270 | 251 | 146 |
| දිගුකාලීන (ශුද්ධ) .. | 6,613 | 8,693 | 7,416 | 8,173 | 5,541 | 260 | 333 | 270 | 251 | 146 |
| ලැබීම් .. | 8,546 | 10,387 | 9,422 | 11,425 | 9,802 | 337 | 398 | 342 | 350 | 257 |
| ගෙවීම් .. | 1,933 | 1,694 | 2,006 | 3,252 | 4,261 | 77 | 65 | 72 | 99 | 111 |
| කෙටිකාලීන (ශුද්ධ) .. | 2 | — | — | — | — | — | — | — | — | — |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | 82 | - 39 | 1,491 | 1,371 | 1,841 | — | — | — | — | — |
| 8. වැරදීම් හා අත්හැරීම් .. | 762 | - 254 | - 205 | - 680 | - 203 | 22 | 13 | - 29 | 10 | 7 |
| 9. විගැහි වෙන්කිරීම් .. | — | — | — | — | — | — | — | — | — | — |
| 10. සමස්ථ ශේෂය .. | 342 | 7,062 | - 1,060 | - 2,124 | - 1,801 | 1 | 297 | - 111 | - 74 | - 72 |
| 11. මූල්‍ය වෙනස්වීම් ( - අතිරික්තය) .. | - 342 | - 7,062 | 1,060 | 2,124 | 1,801 | - 1 | - 297 | 111 | 74 | 72 |
| ශ්‍රී ලංකා රුපියල්/විගැහි (විනිමය අනුපාතිකය සාමාන්‍යය) | | | | | | 25·16 | 26·08 | 27·63 | 32·90 | 38·10 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන : මූල්‍ය අංශයේ සියළුම ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ අනුපාතිකය අනුව පරිවර්ත්‍ය කොට ඇත.

විගැහි අනුව, අපනයන මිළ සියයට 0.3 කින් වැඩිවීමත්, ආනයන මිළ සියයට 2.7 කින් අඩුවීමත් නිසා 1987 දී ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි සමස්ත මිළ සංචලනය ශ්‍රී ලංකාවට මඳ වශයෙන් වාසිදායක විය. ඒ අනුව, 1987 දී වෙළෙඳ අනුපාතයෙහි සුළු වර්ධනයක් දක්නට ලැබුණි. මෙම තත්ත්වය ඇති වූයේ වෙළෙඳ අනුපාතයේ පිළිවෙලින් සියයට 19.8 ක හා සියයට 5.0 ක පිරිහීමක් දක්නට ලැබුණු අහිතකර වෙළෙඳ අනුපාතයක් පැවති වර්ෂ දෙකකට පසුවය.

1986 දී රුපියල් දශ ලක්ෂ 3,617 ක් (විගැහි දශ ලක්ෂ 109) වූ සේවා වෙනුවෙන් කළ ශුද්ධ විදේශ විනිමය ගෙවීම් 1987 දී රුපියල් දශ ලක්ෂ 4,257 ක් (විගැහි දශ ලක්ෂ 114) විය. සේවා ගිණුමේ පිරිහීම සම්පූර්ණයෙන්ම සංචාරක ඉපැයීම්වල තියුණු පහත වැටීම නිසා සිදු වූවකි. මෙයට ප්‍රතිවිරුද්ධ වශයෙන් සේවා ගිණුමේ හිතකර ලක්ෂණයන් ගණනාවක්ද දක්නට ලැබුණි. ඉකුත් දෙවසර තුළ හිඟයක් වශයෙන් පැවති වරාය, ප්‍රවාහනය සහ රක්ෂණය අංශය වරායෙන් ලද ආදායම්වල වැඩිවීම සහ එයාර් ලංකා සමාගම විසින් ඉන්ධන සඳහා විදේශයන්ට කළ ගෙවීම් අඩු වීමේ හේතුවෙන් විගැහි දශ ලක්ෂ 8 ක අතිරික්තයක් 1987 දී වාර්තා කළේය. එයට අමතරව, ආයෝජන ආදායම්, රජයේ වියදම් සහ විවිධ සේවා යන අංශවල හිඟයන්හි අඩු වීමක්ද වසර තුළදී දක්නට ලැබිණි.

පසුගිය වසරේදී වූ රුපියල් දශ ලක්ෂ 5,248 (විගැහි දශ ලක්ෂ 159) හා සසඳන කළ 1987 දී ජා. මූ. අරමුදලේ ණය ඇතුළුව විදේශ ණය සඳහා වූ පොළී සහ අනෙකුත් සේවා ගාස්තු රුපියල් දශ ලක්ෂ 5,929 ක් (විගැහි දශ ලක්ෂ 156) විය. විගැහි අනුව පොළී ගෙවීම්හි අඩු වීමක් දක්නට ලැබීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි පොළී අනුපාතිකයන් පහළ යාම සහ විගැහිවල අගය වැඩිවීමත්ය. මුළු සේවා ගෙවීම්වලින් සියයට 38 ක් වූ පොළී ගෙවීම් තවදුරටත් ගෙවුම් තුලනය මත විශාල පීඩනයක් ඇති කිරීමෙහිලා සමත් විය. වැඩි වශයෙන් මහ බැංකුවේ ආයෝජන ආදායම්වලින් සමන්විත පොළී ඉපැයීම් පසුගිය වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 1,878 (විගැහි දශ ලක්ෂ 58) හා සසඳන විට 1987 දී රුපියල් දශ ලක්ෂ 2,041 (විගැහි දශ ලක්ෂ 53) ක් විය. විගැහි අනුව දක්වෙන මෙම අඩු වීමට බොහෝ දුරට හේතු වූයේ එම ආයෝජන මට්ටම පහළ යාමයි. 1987 දී ලාභ සහ ලාභාංශ වශයෙන් වූ විදේශ විනිමය ගෙවීම් පසුගිය වසරට වඩා අඩු විය.

සේවා ගිණුමේ ඉතාමත් අසතුටුදායක වර්ධනය වූයේ සංචාරක ඉපැයීම් විශාල වශයෙන් පහත වැටීමයි. 1987 දී සංචාරක අංශයෙහි ශුද්ධ විදේශ විනිමය ඉපැයීම් කිසිවක් නොවීය. අවිනිශ්චිත වාතාවරණයක් යටතේ සංචාරකයන්ගේ පැමිණීම 1987 දී සියයට 20.6 කින් පහත වැටුණි. සංචාරක කර්මාන්තයෙන් ඉපැයූ ආදායම 1986 දී රුපියල් දශ ලක්ෂ 2,326 (විගැහි දශ ලක්ෂ 71) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 1,813 (විගැහි දශ ලක්ෂ 48) දක්වා විගැහි වශයෙන් සියයට 32 ක අඩු වීමක් වාර්තා කළේය.

1987 දී පෞද්ගලික සංක්‍රාම වශයෙන් ලැබුණු විදේශ විනිමය ප්‍රමාණය විගැහි අනුව සුළු අඩු වීමක් පෙන්නුම් කළ නමුත් රුපියල් වටිනාකම අනුව සියයට 16 ක වැඩි වීමක් වාර්තා කළේය. පෞද්ගලික සංක්‍රාම වශයෙන් වූ දළ ලැබීම්, රුපියල් දශ ලක්ෂ 10,255 ක් (විගැහි දශ ලක්ෂ 268) විය. 1986 දී එම ලැබීම් රුපියල් දශ ලක්ෂ 8,873 ක්(විගැහි දශ ලක්ෂ 269) විය. යෝජනා ක්‍රම සහ භාණ්ඩ ප්‍රදානවලින් සැදුම්ලත් නිල ප්‍රදාන, 1986 දී විගැහි දශ ලක්ෂ 153 (රුපියල් දශ ලක්ෂ 5,114) සිට 1987 දී විගැහි දශ ලක්ෂ 139 (රුපියල් දශ ලක්ෂ 5,302) දක්වා අඩු විය. යෝජනා ක්‍රම සඳහා ප්‍රදානයන් විගැහි දශ ලක්ෂ 104 ක් (රුපියල් දශ ලක්ෂ 3,940) වූ අතර, ඉතිරිය භාණ්ඩ ප්‍රදානයන් විය. 1987 දී මුළු ශුද්ධ සංක්‍රාම ලැබීම් සියයට 4.1 කින් අඩු විණි.

1987 දී සංක්‍රාමවලින් ලත් ශුද්ධ ආදායම, භාණ්ඩ හා සේවා ගිණුමේ හිඟයෙන් සියයට 59.0 ක් පියැවීමට සමත් විය. 1986 දී එමගින් පියැවිය හැකි වූයේ භාණ්ඩ හා සේවා ගිණුමේ හිඟයෙන් සියයට 52 කි. 1986 දී රුපියල් දශ ලක්ෂ 11,909 ක් (විගැහි දශ ලක්ෂ 363) වූ ජංගම

ගිණුමේ හිඟය 1987 දී රුපියල් දශ ලක්ෂ 10,537 ක් (විගැහි දශ ලක්ෂ 266) වී යයි ගණනය කර ඇත. විගැහි අනුව ජංගම ගිණුමේ හිඟයෙහි සියයට 26.7 ක සතුටුදායක වර්ධනයක් මෙයින් පෙන්නුම් කෙරේ. මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම්, ජංගම ගිණුමේ හිඟයෙන් සියයට 70 ක් පමණක් පියැවීමට ප්‍රමාණවත් වූ හෙයින් රුපියල් දශ ලක්ෂ 1,801 ක් (විගැහි දශ ලක්ෂ 72) වූ සමස්ත හිඟය පියැවීම සඳහා විදේශ වත්කම් උපයෝගී කර ගැණිනා.

**1 . 35 සංඛ්‍යා සටහන**

**1985 – 1987 සේවා සහ සංක්‍රාම**

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1985 | 1986(අ) | 1987(ආ) | 1985 | 1986(අ) | 1987(ආ) |
| 1. වරාය, ප්‍රවාහනය සහ රක්ෂණය .. | – 154 | – 84 | 247 | – 5 | – 3 | 8 |
| ලැබීම් .. | 2,016 | 2,760 | 3,389 | 73 | 84 | 90 |
| ගෙවීම් .. | 2,170 | 2,844 | 3,142 | 78 | 87 | 82 |
| 2. සංචාර .. | 975 | 808 | – 15 | 35 | 25 | 0 |
| ලැබීම් .. | 2,233 | 2,326 | 1,813 | 81 | 71 | 48 |
| ගෙවීම් .. | 1,258 | 1,518 | 1,828 | 46 | 46 | 48 |
| 3. ආයෝජන ආදායම් .. | – 3,445 | – 3,871 | – 4,336 | – 125 | – 117 | – 115 |
| ලැබීම් .. | 2,261 | 1,893 | 2,049 | 82 | 58 | 53 |
| ගෙවීම් .. | 5,706 | 5,764 | 6,385 | 207 | 175 | 168 |
| 3.1 ලාභ සහ ලාභාංශ | – 297 | – 501 | – 448 | – 11 | – 16 | – 12 |
| ලැබීම් .. | 5 | 15 | 8 | — | — | — |
| ගෙවීම් .. | 302 | 516 | 456 | 11 | 16 | 12 |
| 3.2 පොළී .. | – 3,148 | – 3,370 | – 3,888 | – 114 | – 101 | – 103 |
| ලැබීම් .. | 2,256 | 1,878 | 2,041 | 82 | 58 | 53 |
| ගෙවීම් .. | 5,404 | 5,248 | 5,929 | 196 | 159 | 156 |
| 4. රජයේ වියදම් .. | – 152 | – 125 | 26 | – 6 | – 3 | 0 |
| ලැබීම් .. | 310 | 383 | 584 | 11 | 12 | 15 |
| ගෙවීම් .. | 462 | 508 | 558 | 17 | 15 | 15 |
| 5. විවිධ සේවා .. | – 871 | – 345 | – 179 | – 32 | – 11 | – 7 |
| ලැබීම් .. | 2,106 | 3,239 | 3,497 | 76 | 98 | 91 |
| ගෙවීම් .. | 2,977 | 3,584 | 3,676 | 108 | 109 | 98 |
| 6. මුළු සේවා .. | – 3,647 | – 3,617 | – 4,257 | – 133 | – 109 | – 114 |
| ලැබීම් .. | 8,926 | 10,601 | 11,332 | 323 | 323 | 297 |
| ගෙවීම් .. | 12,573 | 14,218 | 15,589 | 456 | 432 | 411 |
| 7. පෞද්ගලික සංක්‍රාම .. | 7,212 | 7,983 | 9,161 | 262 | 242 | 240 |
| ලැබීම් .. | 7,920 | 8,873 | 10,255 | 288 | 269 | 268 |
| ගෙවීම් .. | 708 | 890 | 1,094 | 26 | 27 | 28 |
| 8. නිල සංක්‍රාම .. | 4,828 | 5,114 | 5,302 | 172 | 153 | 139 |
| ලැබීම් .. | 4,828 | 5,114 | 5,302 | 172 | 153 | 139 |
| ගෙවීම් .. | — | — | — | — | — | — |
| 9. මුළු සංක්‍රාම .. | 12,040 | 13,097 | 14,463 | 434 | 395 | 379 |
| ලැබීම් .. | 12,748 | 13,987 | 15,557 | 460 | 422 | 407 |
| ගෙවීම් .. | 708 | 890 | 1,094 | 26 | 27 | 28 |
| 10. මුළු සේවා සහ සංක්‍රාම .. | 8,393 | 9,480 | 10,206 | 301 | 286 | 265 |
| ලැබීම් .. | 21,674 | 24,588 | 26,889 | 783 | 745 | 704 |
| ගෙවීම් .. | 13,281 | 15,108 | 16,683 | 482 | 459 | 439 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1983 සිටම අඩු වෙමින් පැවති මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් 1987 දීද සියයට 33.0 කින් අඩු විය. සෘජු ආයෝජන සහ දිගු, මැදි හා කෙටි කාලීන විදේශ ණය ඇතුළත් පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන ලැබීම් 1987 දී සියයට 46.0 කින් වැඩිවූ අතර, රාජ්‍ය අංශයට ලැබුණු එම ණය ප්‍රමාණයෙහි සියයට 42.0 ක අඩු වීමක් දක්නට ලැබිණ.

## 1.36 සංඛ්‍යා සටහන

## 1985 – 1987 විදේශ සම්පත් පරතරය පියවීම

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1985 | 1986(අ) | 1987 (ආ) | 1985 | 1986(අ) | 1987 (ආ) |
| **1. විදේශීය ඉපැයීම්** .. | **52,574** | **53,367** | **61,862** | **1,907** | **1,622** | **1,640** |
| 1.1 අපනයන .. | 35,728 | 33,893 | 40,275 | 1,296 | 1,030 | 1,075 |
| 1.2 සේවා .. | 8,926 | 10,601 | 11,332 | 323 | 323 | 297 |
| 1.3 පෞද්ගලික සංක්‍රාම .. | 7,920 | 8,873 | 10,255 | 288 | 269 | 268 |
| **2. විදේශීය ගෙවීම්** .. | **82,313** | **86,201** | **94,089** | **2,980** | **2,623** | **2,477** |
| 2.1 ආනයන .. | 55,529 | 55,283 | 61,019 | 2,007 | 1,678 | 1,606 |
| 2.2 සේවා .. | 12,573 | 14,218 | 15,589 | 456 | 432 | 411 |
| 2.3 පෞද්ගලික සංක්‍රාම .. | 708 | 890 | 1,094 | 26 | 27 | 29 |
| 2.4 ප්‍රාග්ධන ආපසු ගෙවීම් .. | 13,503 | 15,810 | 16,387 | 491 | 486 | 431 |
| **3. විදේශීය සම්පත් පරතරය** .. | **-29,739** | **-32,834** | **-32,227** | **-1,073** | **-1,001** | **- 837** |
| **4. සම්පත් පරතරය පියවීම** .. | **-29,739** | **-32,834** | **-32,227** | **-1,073** | **-1,001** | **- 837** |
| **4.1 ණයගැති භාවය කෙරෙහි බල-නොපාන ගණුදෙනු** .. | **5,543** | **5,924** | **6,396** | **198** | **178** | **168** |
| 4.1.1 නිල ප්‍රදාන .. | **4,828** | 5,114 | 5,303 | 172 | 153 | 139 |
| 4.1.2 සෘජු ආයෝජන .. | **715** | 810 | 1,093 | 26 | 25 | **28** |
| 4.1.3 විගැහි වෙන් කිරීම් .. | — | — | — | — | — | — |
| **4.2 ණය ලබා ගැනීම් සහ සංචිත උපයෝගී කර ගැනීම්** .. | **22,911** | **26,219** | **24,193** | **904** | **813** | **662** |
| 4.2.1 දිගුකාලීන ණය .. | 8,834 | 10,227 | 8,610 | 320 | 313 | 226 |
| 4.2.2 කෙටිකාලීන ණය .. | 9,055 | 8,399 | 7,769 | 327 | 257 | 203 |
| 4.2.3 සැපයුම්කරුවන්ගේ ණය සහ අනිකුත් දිගුකාලීන ණය | 588 | 1,198 | 1,192 | 22 | 37 | 31 |
| 4.2.4 වාණිජ ණය ගැනීම් (පෞද්ගලික අංශය) .. | 2,407 | 2,346 | 2,243 | 88 | 71 | 59 |
| 4.2.5 බැංකු ණය ගැනීම් .. | 3 | — | 1,801 | — | — | 42 |
| 4.2.6 ද්විපාර්ශ්වික ශේෂ .. | — | — | — | — | — | — |
| 4.2.7 ජා. මූ. අ. කළ ගැණුම් (ඇ) | 237 | 1,614 | 1,120 | — | — | — |
| 4.2.8 සංචිත .. | 574 | 1,215 | - 982 | 124 | 119 | 76 |
| 4.2.9 වෙනත් .. | 1,213 | 1,220 | 2,440 | 23 | 16 | 25 |
| **5. රුපියල් අගය පිළිබඳ ගැලපිලි** .. | **1,491** | **1,371** | **1,841** | — | — | — |
| **6. වැරදීම් හා අත්හැරීම්** .. | **- 206** | **- 680** | **- 203** | **- 29** | **10** | **7** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජා. මූ. අරමුදලේ ගිණුම් රුපියල් අගය හා ගැලපීමේදී ඇති වූ ශුද්ධ වෙනස්කම් මෙම රුපියල් සංඛ්‍යා වලින් පෙන්නුම් කෙරේ.

සෘජු ආයෝජන වශයෙන් පෞද්ගලික අංශයට ලැබුණු ප්‍රාග්ධන ලැබීම් 1986 දී විගැහි දශ ලක්ෂ 25 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 28 දක්වා වැඩි විය. මහ කොළඹ ආර්ථික කොමිසමට අයත් ව්‍යවසායයන්හි සෘජු ආයෝජන ප්‍රමාණය මේ වසරේදී අඩු වූ අතර, විදේශ ආයෝජන උපදේශක කමිටුව යටතේ වූ ව්‍යවසායයන්හි සෘජු ආයෝජනයන් වැඩි විය. විගැහි දශ ලක්ෂ

75 ක් වූ විදේශීය ණය ආපසු ගෙවීම් අඵතින් ලබාගන්නා ලද ණය ප්‍රමාණය වූ විගැහි දශ ලක්ෂ 59 ක ප්‍රමාණය ඉක්මවූ හෙයින් පෞද්ගලික අංශයෙන් ශුද්ධ ප්‍රාග්ධන ගලායැමක් සිදු විය. කෙසේ වුවද, 1986 දී විගැහි දශ ලක්ෂ 11 කින් අඩුවූ සැපයුම්කරුවන්ගේ ණය, වෙළෙඳ ණය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණයවලින් සමන්විත පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම් 1987 දී විගැහි දශ ලක්ෂ 30 කින් වැඩි විය.

යෝජනා ක්‍රම සහ යෝජනා ක්‍රම නොවන ණය වශයෙන් වූ දළ නිල ප්‍රාග්ධන ලැබීම් 1986 දී ලද රුපියල් දශ ලක්ෂ 11,425 (විගැහි දශ ලක්ෂ 350) හා සසඳන කල 1987 දී රුපියල් දශ ලක්ෂ 9,802 ක් (විගැහි දශ ලක්ෂ 257) වී යැයි ගණනය කර ඇත. රජයේ ප්‍රාග්ධන වියදම්වල සැළකිය යුතු අඩු වීමක් සමඟ යෝජනා ක්‍රම ණය ප්‍රමාණයද 1987 දී සියයට 22.0 කින් පහත වැටිණි. පසුගිය වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 9,612 ක් (විගැහි දශ ලක්ෂ 293) වූ මුදාහරින ලද යෝජනා ක්‍රම ණය ප්‍රමාණය 1987 දී රුපියල් දශ ලක්ෂ 8,703 ක්(විගැහි දශ ලක්ෂ 228) විණි. 1986 දී රුපියල් දශ ලක්ෂ 1,813 ක් (විගැහි දශ ලක්ෂ 56) වූ මුදාහරිනු ලැබූ ද්‍රව්‍යාධාර ණය 1987 දී රුපියල් දශ ලක්ෂ 1,099 ක් (විගැහි දශ ලක්ෂ 29) විය. ජංගම ගිණුමේ හිඟය පියැවීම සඳහා ගතහැකි නිල ප්‍රාග්ධන ලැබීම් වශයෙන් ලද ශුද්ධ සම්පත්වල අඩු වීමක් ඇති කරමින්, 1987 දී රජයේ ණය ආපසු ගෙවීම් සියයට 12.1 කින් වැඩි විය.

**විදේශ වත්කම්**

1987 දී නොකඩවා තෙවැනි වසරටත්, රටේ විදේශ සම්පත් තත්ත්වය දැඩි පීඩනයකට ලක්විණි. මෙය දළ සහ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණයන්හි විශාල අඩුවීම් වලින් පෙන්නුම් කෙරිණි. 1987 දී දළ විදේශ වත්කම් සියයට 15.5 කින් අඩු විය. පසුගිය වසරේදී වූ විගැහි දශ ලක්ෂ 492 (රුපියල් දශ ලක්ෂ 17,152) හා සසඳන කල 1987 දී දළ විදේශ වත්කම් ප්‍රමාණය විගැහි දශ ලක්ෂ 415 ක් (රුපියල් දශ ලක්ෂ 18,134) විය.


රජය සහ මහ බැංකුව සතු දළ විදේශ වත්කම්වලින් සමන්විත දළ නිල සම්පත් ප්‍රමාණය 1987 තුල සියයට 32 කින් අඩුවී වර්ෂය අවසානයේ විගැහි දශ ලක්ෂ 203 ක්ව (රුපියල් දශ ලක්ෂ 8,869) පැවතුණි. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි වූ රජයේ තැන්පතු සම්පූර්ණයෙන්ම වාගේ ප්‍රයෝජනයට ගන්නා ලද අතර මහ බැංකුව සතු දළ වත්කම් 1986 දී පැවති විගැහි දශ ලක්ෂ 274 (රුපියල් දශ ලක්ෂ 9,547) සිට 1987 දී විගැහි දශ ලක්ෂ 203 (රුපියල් දශ ලක්ෂ 8,840) දක්වා අඩු විය. විදේශයන්හි පැවති ද්‍රවශීල වත්කම්වල මෙන්ම ආයෝජන ප්‍රමාණයෙහිද අඩු වීමක් වාර්තා කෙරිණි. එයට අමතරව පසුගිය වර්ෂයේදී මහ බැංකුවේ කෙටි කාලීන ණය ගැනීම් කිසිවක් නොතිබුනු අතර, 1987 දී එම ණයගැනීම් විගැහි දශ ලක්ෂ 41 දක්වා ඉහළ නැඟුණි. කෙසේ වුවද, වෙළෙඳ බැංකුවල දළ විදේශීය වත්කම්හි විගැහි දශ ලක්ෂ 195 (රුපියල් දශ ලක්ෂ 6,803) සිට විගැහි දශ ලක්ෂ 212 (රුපියල් දශ ලක්ෂ 9,265) දක්වා සුළු වැඩි වීමක් වාර්තා විය. 1987 අවසානයේදී තිබූ දළ විදේශ වත්කම් ප්‍රමාණය 1988 සඳහා ඉලක්ක කර ඇති ආනයන වියදමෙන් මාස 3 ක ප්‍රමාණයක් පියැවීම සඳහා සෑහින.

**විනිමය අනුපාතිකයේ සංචලනයන්**

1987 වර්ෂය තුළ ප්‍රධාන මුදල් වර්ගයන් බොහොමයකට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලෙහි අගය තියුණු ලෙස පහත වැටුණි. එය ජපන් යෙන්වලට ප්‍රතිමුඛව සියයට 28.0 කින්ද, ස්ටර්ලින් පවුමට ප්‍රතිමුඛව සියයට 26.9 කින්ද, ඩොයිෂ් මාර්කයට ප්‍රතිමුඛව සියයට 23.9 කින් සහ ප්‍රංශ ෆ්‍රෑන්ක්වලට ප්‍රතිමුඛව සියයට 22.1 කින්ද පහත වැටුණි. ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 10.0 කින් සහ මැදිහත් මුදල් වර්ගය වූ එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිමුඛව සියයට 7.3 කින්ද එහි අගය අඩු විය. ශ්‍රී ලංකා රුපියල හා එක්සත් ජනපද ඩොලරය අතර විනිමය අනුපාතිකයේ වෙනස්වීම සහ විගැහිවලට ප්‍රතිමුඛව එක්සත් ජනපද ඩොලරයේ පිරිහීමත් හේතුකොට ගෙන ශ්‍රී ලංකා රුපියලෙහි අගය විගැහිවලට ප්‍රතිමුඛව සියයට 19.6 කින් පහත වැටුණි.

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 37 සංඛ්‍යා සටහන

## 1983 – 1987 විනිමය අනුපාතික වෙනස්වීම්

| මුදල් වර්ගය | වර්ෂය අවසානයේ විනිමය අනුපාතික (රුපියල්) | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 | 1986 | 1987 | 1983 | 1984 | 1985 | 1986 | 1987 |
| ඇ.එ.ජ. ඩොලර් .. | 25·0000 | 26·2800 | 27·4075 | 28·5200 | 30·7625 | – 14·72 | – 4·87 | – 4·11 | – 3·90 | – 7·29 |
| එ.රා. ස්ටර්ලින් පවුම් .. | 35·8938 | 30·5111 | 39·5764 | 41·7961 | 57·1721 | – 3·57 | 17·64 | – 22·91 | – 5·31 | – 26·89 |
| ඩොයිෂ් මාර්ක් .. | 9·1050 | 8·3495 | 11·1074 | 14·6727 | 19·2826 | – 1·37 | 9·05 | – 24·83 | – 24·30 | – 23·91 |
| ජපන් යෙන් .. | 0·1071 | 0·1050 | 0·1360 | 0·1794 | 0·2491 | – 14·83 | 2·05 | – 22·81 | – 24·18 | – 27·99 |
| ප්‍රංශ ප්‍රෑන්ක් .. | 2·9744 | 2·7276 | 3·6167 | 4·4337 | 5·6936 | 6·66 | 9·05 | – 24·58 | – 18·43 | – 22·13 |
| ඉන්දියානු රුපියල් .. | 2·3531 | 2·1192 | 2·2575 | 2·1645 | 2·4043 | – 8·22 | 11·04 | – 6·13 | 4·30 | – 9·97 |
| විශේෂ ගැණුම් හිමිකම් .. | 26·1260 | 25·8065 | 30·0339 | 34·7998 | 43·2684 | – 9·83 | 1·24 | – 14·08 | – 13·70 | – 19·57 |


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සෘණ සලකුණින් දක්වෙන්නේ අගය අඩු වීමයි.

(ආ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කරගෙනය.

# නාමික විනිමය අනුපාතික*

1978=100





ශ්‍රී ලංකා මහ බැංකුව.

* දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

## සඵල විනිමය අනුපාතික*

1978 = 100




ශ්‍රී ලංකා මහ බැංකුව.

* දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම පාවීමට ඉඩ හැරීම ආරම්භ වූ 1977 නොවැම්බර් 16 දින සිට ඇතිවූ සමුච්චිත වෙනස්වීම්වලට අනුව 1987 අවසානය වනවිට එය එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිමුඛව සියයට 48.0 කින්ද, ස්ටර්ලින් පවුමට ප්‍රතිමුඛව සියයට 49.2 කින්ද, ඩොයිෂ් මාර්කයට ප්‍රතිමුඛව සියයට 63.1 කින්ද, ප්‍රංශ ෆ්‍රෑන්ක්වලට ප්‍රතිමුඛව සියයට 42.3 කින්ද, ජපන් යෙන්වලට ප්‍රතිමුඛව සියයට 73.8 කින්ද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 23.0 කින් සහ විගැහිවලට ප්‍රතිමුඛව සියයට 56.3 කින්ද පහත වැටී ඇති බව පෙනී යයි. මේ අනුව බලන විට, 1977 සිට ශ්‍රී ලංකා රුපියලේ අගය වැඩිම ප්‍රමාණයකින් පහත වැටී ඇත්තේ ජපන් යෙන් වලට ප්‍රතිමුඛවය.

ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග අතර විනිමය අනුපාතිකයේ වෙනස්වීම් මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ ගෙවීම් තත්ත්වයේ දුර්වලත්වයද විදහා දක්වමින්, ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් සමඟ වෙළෙඳ බර තැබීම් මත පිළියෙල වූ නාමික විනිමය අනුපාතිකය ලෙස විග්‍රහ කෙරෙන ශ්‍රී ලංකාවේ සඵල නාමික අනුපාතිකය 1987 දී සියයට 19.9 කින් පහත වැටිණි. එම අනුපාතිකය ශ්‍රී ලංකාව හා ඇගේ වෙළෙඳ හවුල්කරුවන් අතර උද්ධමන වෙනස්කම් සඳහා ගලපා ගත් පසු ලැබෙන සඵල මූර්ත විනිමය අනුපාතිකය වර්ෂය තුළ සියයට 17.3 කින් අඩු විය. 1987 දී සඵල නාමික විනිමය අනුපාතිකයේ සහ සඵල මූර්ත විනිමය අනුපාතිකයේ පිරිහීමෙහි සාමාන්‍යය පිළිවෙලින් සියයට 17.1 සහ සියයට 11.9 ක් විය.

**විදේශ ණය**

කෙටි කාලීන වෙළෙඳ ණය සහ මහ බැංකුවේ එතෙර ණයවලින් සමන්විත, ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය 1986 දී රුපියල් දශ ලක්ෂ 116,429 (විගැහි දශ ලක්ෂ 3,359) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 144,531 (විගැහි දශ ලක්ෂ 3,361) දක්වා ඉහළ නැඟුණි. විගැහි වටිනාකම අනුව විදේශීය ණයෙහි සුළු වැඩි වීමක් මෙයින් පෙන්නුම් කෙරේ. විගැහි අනුව විදේශීය ණයෙහි මෙම වැඩි වීමට බොහෝ සෙයින් හේතු වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය වෙනුවෙන් කළ ප්‍රතිමිළදී ගැනීමය. එක්සත් ජනපද ඩොලරයට එරෙහිව විගැහි අගය වැඩිවීම නිසා එක්සත් ජනපද ඩොලර්වලින් ලබාගන්නා ලද ණය සම්බන්ධ වගකීම් (විගැහි අනුව) අඩු විය. කෙසේ වුවද, මුළු විදේශීය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත්විට 1986 දී සියයට 61.6 සිට 1987 දී සියයට 64.1 දක්වා වැඩි විය.

**1 . 38 සංඛ්‍යා සටහන**

**1985 – 1987 නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය (මුදහරින ලද)**

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1985 | 1986 (අ) | 1987 (ආ) | 1985 | 1986 (අ) | 1987 (ආ) |
| **1. මැදි හා දිගු කාලීන ණය** .. | **83,883** | **103,481** | **129,993** | **2,793·0** | **2,973·6** | **3,004·3** |
| 1. අ. රජය .. | 70,046 | 88,727 | 113,656 | 2,332·3 | 2,549·6 | 2,626·7 |
| 1. ආ. රජය ඇප වූ රාජ්‍ය සංස්ථා .. | 9,212 | 8,497 | 8,126 | 306·7 | 244·2 | 187·7 |
| 1. ඇ. රජය ඇපවූ පෞද්ගලික අංශය .. | 922 | 2,247 | 4,172 | 30·7 | 64·5 | 96·5 |
| 1. ඈ. රජය ඇප නොවූ රාජ්‍ය සංස්ථා .. | 644 | 741 | 298 | 21·4 | 21·3 | 6·9 |
| 1. ඉ. රජය ඇප නොවූ පෞද්ගලික අංශය | 3,059 | 3,270 | 3,740 | 101·9 | 94·0 | 86·5 |
| **2. කෙටි කාලීන ණය** .. | **5,645** | **5,277** | **8,313** | **187·5** | **151·3** | **191·6** |
| 2. අ. බැංකු ණය .. | 6 | — | 1,802 | 0·2 | — | 41·3 |
| 2. ආ. වෙනත් .. | 5,639 | 5,277 | 6,511 | 187·3 | 151·3 | 150·3 |
| **3. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැනීම** | **7,914** | **7,672** | **6,226** | **292·5** | **234·0** | **164·7** |
| **4. මුළු ණය (1+2+3)** .. | **97,442** | **116,429** | **144,531** | **3,273·0** | **3,358·9** | **3,360·6** |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහන ණය, වෙළඳ ණය සහ ම. කො. ආ. කොමිසම යටතේ ඇති ව්‍යවසායයන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබාගත් ණයද ඇතුළත්වේ.

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.

## 1 . 39 සංඛ්‍යා සටහන

## 1983 – 1987 නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය (මුද හරින ලද) (අ)

| ශීර්ෂය | | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1983 | 1984 | 1985 | 1986 | 1987(ආ) | 1983 | 1984 | 1985 | 1986 | 1987(ආ) |
| 1. මැදි හා දිගුකාලීන ණය (ඇ) එයින් | .. | 46,885 | 54,283 | 69,518 | 88,208 | 113,127 | 1,794·6 | 2,103·5 | 2,314·7 | 2,534·7 | 2,614·5 |
| 1. අ. යෝජනා ක්‍රම ණය | .. | 21,126 | 27,396 | 39,332 | 53,721 | 73,959 | 808·6 | 1,061·6 | 1,309·6 | 1,543·7 | 1,709·3 |
| 1. ආ. යෝජනා ක්‍රම නොවන ණය | .. | 22,756 | 23,982 | 27,595 | 32,427 | 37,691 | 871·0 | 929·3 | 918·8 | 931·8 | 871·1 |
| 1. ඇ. ජා. මූ. අ. භාරකාරත්ව අරමුදල් ණය | | 3,004 | 2,905 | 2,591 | 2,061 | 1,477 | 115·0 | 112·6 | 86·3 | 59·2 | 34·1 |
| 2. සැපයුම් කරුවන්ගේ ණය | .. | 894 | 610 | 687 | 861 | 1,159 | 34·4 | 23·6 | 22·8 | 24·6 | 26·7 |
| 3. ජා. මූ. අ. භාවිත ණය | .. | 8,225 | 8,644 | 7,914 | 7,672 | 6,226 | 331·1 | 328·3 | 292·5 | 234·0 | 164·7 |
| 4. බැංකු ණය | .. | 1,854 | 3 | 6 | — | 1,802 | 70·8 | 0·1 | 0·2 | — | 41·3 |
| 5. වෙනත් (ඈ) | .. | 14,321 | 14,873 | 19,317 | 19,689 | 22,219 | 543·6 | 581·2 | 642·8 | 565·6 | 513·4 |
| 6. එකතුව | .. | 72,179 | 78,413 | 97,442 | 116,429 | 144,531 | 2,774·5 | 3,036·7 | 3,273·0 | 3,358·9 | 3,360·6 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.

(අ) 1983 සිට 1986 දක්වා සංඛ්‍යා සංශෝධනය කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) සැපයුම් කරුවන්ගේ ණය අත්හැරීමෙන් පසු රජයේ ණය
(ඈ) රාජ්‍ය සංස්ථාවල හා එයාර් ලංකා සමාගමේ වෙළෙඳ ණය, ම. කො. ආර්ථික කොමිසම යටතේ ඇති සහ අනෙකුත් අනුමත ව්‍යවසායයන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ගත් ණය, පෞද්ගලික විදේශීය ණය ගැනීම් සහ වෙළෙඳ ණයවලින් සමන්විතය.

## 1 . 40 සංඛ්‍යා සටහන

## 1983 – 1987 විදේශීය ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1983 | 1984 | 1985 | 1986(අ) | 1987(ආ) | 1983 | 1984 | 1985 | 1986(අ) | 1987(ආ) |
| 1. ණය සේවා ගෙවීම් .. | 7,135·8 | 8,026·1 | 9,361·8 | 11,657·6 | 14,867·4 | 287·1 | 308·0 | 340·6 | 356·7 | 391·1 |
| 1·1 ණය ආපසු ගෙවීම් .. | 3,120·7 | 3,437·7 | 4,533·2 | 6,940·0 | 9,743·0 | 126·5 | 132·3 | 165·5 | 213·4 | 256·1 |
| (i) ජා. මූ. අරමුදලට .. | 1,097·5 | 593·3 | 967·4 | 1,856·0 | 2,565·8 | 46·2 | 22·7 | 35·8 | 58·5 | 69·4 |
| (ii) අනෙකුත් .. | 2,023·4 | 2,844·4 | 3,565·8 | 5,084·0 | 7,177·2 | 80·3 | 109·6 | 129·7 | 154·9 | 186·7 |
| 1·2 පොළී ගෙවීම් .. | 4,015·1 | 4,588·4 | 4,828·6 | 4,717·6 | 5,124·4 | 160·6 | 175·7 | 175·1 | 143·3 | 135·0 |
| (i) ජා. මූ. අරමුදලට .. | 749·3 | 819·2 | 745·6 | 700·9 | 663·1 | 30·8 | 31·4 | 27·1 | 21·3 | 18·3 |
| (ii) අනෙකුත් .. | 3,265·8 | 3,769·2 | 4,083·0 | 4,016·7 | 4,461·3 | 129·8 | 144·3 | 148·0 | 122·0 | 116·7 |
| 2. භාණ්ඩ හා සේවා අපනයන .. | 33,071·6 | 45,764·9 | 44,654·9 | 44,494·6 | 51,607·4 | 1,312·9 | 1,756·1 | 1,619·0 | 1,352·6 | 1,372·0 |
| 3. භාණ්ඩ හා සේවා අපනයන සහ පෞද්ගලික සංක්‍රාම ලැබීම් .. | 39,987·2 | 53,418·0 | 52,574·0 | 53,367·4 | 61,862·0 | 1,588·0 | 2,049·6 | 1,906·6 | 1,622·4 | 1,640·0 |
| 4. ණය සේවා අනුපාතික (ඇ) | | | | | | | | | | |
| 4·1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 21·6 | 17·5 | 21·0 | 26·2 | 28·8 | 21·9 | 17·5 | 21·0 | 26·4 | 28·5 |
| (ii) ජා. මූ. අ. ගණුදෙනු හැර .. | 16·0 | 14·5 | 17·1 | 20·5 | 22·6 | 16·0 | 14·5 | 17·2 | 20·5 | 22·1 |
| 4·2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 17·8 | 15·0 | 17·8 | 21·8 | 24·0 | 18·1 | 15·0 | 17·9 | 22·0 | 23·8 |
| (ii) ජා මූ. අ. ගණුදෙනු හැර .. | 13·2 | 12·4 | 14·5 | 17·1 | 18·8 | 13·2 | 12·4 | 14·6 | 17·1 | 18·5 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදුවූ වෙනස්වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් එකිනෙකට වෙනස් වේ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 දී රුපියල් දශ ලක්ෂ 103,481 ක්වූ නොපියවූ මැදි හා දිගු කාලීන ණය ප්‍රමාණය 1987 දී රුපියල් දශ ලක්ෂ 129,993 දක්වා වැඩි විය. එහෙත් විගැහි වටිනාකම අනුව දක්වෙනුයේ සුළු වැඩි වීමකි. කෙසේ වුවද, වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,802 ක් (විගැහි දශ ලක්ෂ 41) වූ මහ බැංකුවේ කෙටි කාලීන ණය ලබා ගැනීම් නිසා කෙටි කාලීන ණය ප්‍රමාණය සියයට 26 කින් ඉහළ නැඟුණි. 1987 අවසානයේදී මැදි හා දිගු කාලීන ණය, නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 90 ක් වූ අතර, කෙටි කාලීන ණය සියයට 6.0 ක්ද, ඉතිරි සියයට 4.0 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැණුම් වෙනුවෙන්ද විය.

රාජ්‍ය සංස්ථා හා පෞද්ගලික අංශය විසින් ලබා ගන්නා ලද, නොපියවා ඉතිරිව ඇති රජයේ ඇප රහිත මැදි හා දිගු කාලීන ණය ප්‍රමාණයෙහි සැළකිය යුතු අඩු වීමක් දක්නට ලැබිණ. රාජ්‍ය සංස්ථාවල රජයේ ඇපය සහිත ණය විගැහි දශ ලක්ෂ 244 (රුපියල් දශ ලක්ෂ 8,497) සිට 1987 දී විගැහි දශ ලක්ෂ 188 (රුපියල් දශ ලක්ෂ 8,126) දක්වා අඩු විය. පෞද්ගලික අංශයේ රජයේ ඇප සහිත මැදි හා දිගු කාලීන ණය විගැහි දශ ලක්ෂ 94 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 87 දක්වා පහත වැටුණි. 1987 දී රජයේ නොපියවූ ණය විගැහි දශ ලක්ෂ 2,627 (රුපියල් දශ ලක්ෂ 1,13,656) දක්වා වැඩිවූ අතර, පසුගිය වර්ෂයේ එය විගැහි දශ ලක්ෂ 2,550 ක් (රුපියල් දශ ලක්ෂ 88,727) විය. 1986 දී විගැහි දශ ලක්ෂ 1,544 (රුපියල් දශ ලක්ෂ 53,721) වූ නොපියවූ යෝජනා ක්‍රම ණය විගැහි දශ ලක්ෂ 1,709 (රුපියල් දශ ලක්ෂ 73,959) දක්වා වැඩි විය. රජයේ යෝජනා ක්‍රම නොවන ණය විගැහි අනුව සියයට 6.5 කින් පහත වැටුණි. වර්ෂය තුළදී ප්‍රතිමිළදී ගැනීම් විශාල ප්‍රමාණයක් තිබීමේ හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවිය යුතු ණය ප්‍රමාණය 1986 දී විගැහි දශ ලක්ෂ 234 (රුපියල් දශ ලක්ෂ 7,672) සිට 1987 දී විගැහි දශ ලක්ෂ 165 (රුපියල් දශ ලක්ෂ 6,226) දක්වා අඩු විය.

**ණය සේවා ගෙවීම්**

මුළු මැදි හා දිගු කාලීන ණය ආපසු ගෙවීම් සහ සියලුම විදේශීය ණය සඳහා වූ පොළී ගෙවීම් ඇතුලත් ණය සේවා ගෙවීම් 1986 දී රුපියල් දශ ලක්ෂ 11,658 (විගැහි දශ ලක්ෂ 357) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 14,867 (විගැහි දශ ලක්ෂ 391) දක්වා වැඩි විය. මුළු ණය ආපසු ගෙවීම් 1986 දී රුපියල් දශ ලක්ෂ 6,940 (විගැහි දශ ලක්ෂ 213) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 9,743 (විගැහි දශ ලක්ෂ 256) දක්වා සියයට 19.9 කින් වැඩි විය. කෙසේ වුවද, 1987 දී පොළී ගෙවීම් විගැහි අනුව සියයට 5.8 කින් පහත වැටුණි. ජා. මූ. අරමුදලේ ණය සඳහා වූ සේවා ගෙවීම් සියයට 14.0 කින් අඩුවූ අතර, 1986 දී විගැහි දශ ලක්ෂ 59 ක ප්‍රතිමිළදී ගැනීම් හා සැසඳීමේදී 1987 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ණය සම්බන්ධ ප්‍රතිමිළදී ගැනීම් විගැහි දශ ලක්ෂ 69 ක් විය.

වෙළෙඳ භාණ්ඩ සහ සේවා අපනයන, මුළු ණය සේවා ගෙවීම්හි අනුපාතයක් වශයෙන් ගත් කල 1986 දී සියයට 26.4 සිට 1987 දී සියයට 28.5 දක්වා වැඩි විය. ණය සේවා අනුපාතයේ මෙම ඉහළ යාමට හේතු වූයේ භාණ්ඩ හා සේවා අපනයනයෙන් ඉපැයෙන විදේශ විනිමය ප්‍රමාණයේ වර්ධනය මන්දගාමීව තිබියදී ණය ආපසු ගෙවීම් නොකඩවා වැඩි වීමයි. ජා. මූ. අරමුදලේ ගණුදෙනු අත්හළ පසු ණය සේවා අනුපාතිකය කලින් වසරේදී සියයට 20.5 ක් වූ අතර 1987 දී සියයට 22.0 ක් විය. සමස්ත ණය සේවා ගෙවීම්, නිල සංක්‍රාම අත්හල පසු මුළු ජංගම ගිණුමේ ලැබීම්හි අනුපාතයක් වශයෙන් ගත්කළ 1986 දී සියයට 22.0 ක් වූ අතර, 1987 දී සියයට 23.8 ක් විය.